ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# AA2 විභාගය - 2019 ජනවාරි

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# විෂය අංක (AA25)

## ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම
## (BLE)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

## AA2 විභාගය - 2019 ජනවාරි
## (AA25) ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම

## යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

**අනිවාර්ය ප්‍රශ්න දහයකි. (10)**

**(මුළු ලකුණු 20)**

### 01 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්න අංකය | උත්තරය | යොමුව |
|---|---|---|
| 1.1 | (4) | 01 පරිච්ඡේදය - ශ්‍රී ලංකාවේ නීති හා නියාමන රාමුව පිළිබඳව හැඳින්වීම |
| 1.2 | (3) | 02 පරිච්ඡේදය - ගිවිසුම් නීතිය |
| 1.3 | (3) | 02 පරිච්ඡේදය - ගිවිසුම් නීතිය |
| 1.4 | (4) | 08 පරිච්ඡේදය - රක්ෂණ නීතිය, කුලී සින්නක්කර ගිවිසුම් සහ කල්බදු |
| 1.5 | (3) | 04 පරිච්ඡේදය - ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර (ප්‍රතිදේය පත්‍රයන්) |
| 1.6 | (4) | 02 පරිච්ඡේදය - ගිවිසුම් නීතිය |
| 1.7 | (2) | 09 පරිච්ඡේදය - අන්තර්ජාතික වෙළෙඳාම |

1.8 05 පරිච්ඡේදය - නියෝජ්‍යත්ව නීතිය

**පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක්**

| | | | |
|---|---|---|---|
| a. | ප්‍රකාශිතව | - | By Expression |
| b. | ව්‍යංගයෙන් | - | By Implication |
| c. | ප්‍රතිබන්ධනයෙන් | - | By Estoppel |
| d. | අපරානුමැතියෙන් | - | By Ratification |
| e. | අවශ්‍යතාවය මත | - | By Necessity |

1.9 **04 පරිච්ඡේදය - ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර (ප්‍රතිදේය පත්‍රයන්)**

**පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක්**

(a) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය

(b) ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණකාධිකරණ ප්‍රමිතීන් නියාමන හා අධීක්ෂණ මණ්ඩලය

(c) සුරකුම්පත් හා විනිමය පාලන කොමිෂන් සභාව

(d) කොළඹ කොටස් වෙළඳපොළ

(e) ආයෝජන මණ්ඩලය

(f) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

(g) රේගු දෙපාර්තමේන්තුව

(h) ශ්‍රී ලංකා මහ බැංකුව

(i) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

1.10 **08 පරිච්ඡේදය - රක්ෂණ නීතිය, කුලී සින්නක්කර ගිවිසුම් සහ කල්බදු**

වෘත්තීමය හා ව්‍යාපාරික සබඳතාවයන්හි ප්‍රතිඵලයක් වශයෙන් ගණකාධිකාරීවරයෙකු විසින් අත්පත් කර ගන්නා තොරතුරු නිසි අධිකාරී බලය නොමැතිව තුන්වන පාර්ශවයන්ට අනාවරණය නොකිරීමට වගබලාගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවයයි.

ඔහුට එවන් දෙයක් කළ හැක්කේ රහසිගත තොරතුරු හෙළි කිරීමට නීතිමය හෝ වෘත්තිමය බැඳීමක් ඇත්නම් පමණි. පුද්ගලික ලාභ හෝ වාසි ලබාගැනීම සඳහා වෘත්තීමය හා ව්‍යාපාරික සබඳතා හරහා ලබාගත් එවන් රහසිගත තොරතුරු ඔහු විසින් භාවිත නොකළ යුතුය.

***(මුළු ලකුණු 20)***

***A* කොටසෙහි අවසානය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## 02 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| 05 පරිච්ඡේදය - නියෝජ්‍යත්ව නීතිය |
|---|

යම් කිසි පුද්ගලයෙක් තමන්ගේ ක්‍රියාවන් ඉටු කිරීමේ බලය හෝ තමන් වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමේ බලය වෙනත් පුද්ගලයෙකුට ලබා දුන් අවස්ථාවේදී නියෝජ්‍යත්වය නම් වූ සම්බන්ධය ඇති වේ. බලය පවරනු ලැබූ තැනැත්තා ප්‍රධානියා ලෙසත් බලය ලබාගනු ලැබූ තැනැත්තා නියෝජිතයා ලෙසත් හැඳින්වේ. එවන් සම්බන්ධයක් ඇති වූ කල්හි නියෝජිතයා විසින් සිදු කරනු ලැබූ ගණුදෙණු සම්බන්ධයෙන් ප්‍රධානියා වගකීමට ලක්වෙයි.

ප්‍රධානියා විසින් පූර්වයෙන් දුන් බලයක් නොමැතිව නියෝජිතයා කටයුතු කර ඇත්නම් හා එසේ කටයුතු කර ඇත්තේ හදිසි තත්වයක් යටතේ නම් **අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය** මත නියෝජිතයාගේ ක්‍රියාව සම්බන්ධයෙන් ප්‍රධානියා වග කිව යුතුය.

*නඩු තීන්දු - Great Northern Railway Company V Swafeeld*

අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වයක් ඇති වීමට පහත කරුණු සම්පූර්ණ විය යුතුය.

- ප්‍රධානියාගේ උපදෙස් ලබා ගැනීමට නොහැකි තරමේ හදිසි අවශ්‍යතාවයක් උද්ගත වී තිබිය යුතුය.
- එසේ කටයුතු කිරීමට සත්‍ය වාණිජමය අවශ්‍යතාවයක් පැවතිය යුතුය.
- නියෝජිතයා ප්‍රධානියාගේ යහපත පිණිස සත්භාවයෙන් කටයුතු කොට තිබිය යුතුය.

ප්‍රශ්න ගත සිදුවීමේදී ධාරානිපාත වැසි තත්වය නිසා දයාබරන්ට ප්‍රධානියා වූ දයා ට්‍රේඩින් සමාගම සමඟ සන්නිවේදනයක් පවත්වා ගැනීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇත. වානේ යනු ඉක්මණින් නශ්‍ය නොවන ද්‍රව්‍යයක් බැවින් වැසි තත්වය පහව ගොස් ප්‍රධානියාගේ උපදෙස් පැතිය හැකි තත්වයක් උද්ගත වන තෙක් නියෝජිතයාගේ භාරයේ තබා ගත හැකියාව පවතී. එසේම වානේ ඉක්මනින් අලෙවි නොකිරීමෙන් ප්‍රධානියාට සිදුවිය හැකි ආර්ථික අලාභයක් සම්බන්ධයෙන් ඉඟියක් හෝ නියෝජිතයාගේ දැනුවත්භාවයක් නොමැත. ඒ අනුව ප්‍රධානියා වූ දයා ට්‍රේඩින් සමාගම සමඟ සන්නිවේදනයන් පවත්වාගත නොහැකි ධාරානිපාත වැසි පවතින තත්වය පහවීමට ප්‍රථම වානේ වෙනත් පාර්ශවයකට අලෙවි කිරීමට හදිසි හා සත්‍ය වාණිජමය අවශ්‍යතාවයක් නියෝජිතයා වූ දයාබරන්ට උද්ගත වී නොමැත.

එබැවින් දයාබරන් විසින් වෙනත් පාර්ශවයකට වානේ අලෙවි කිරීම මත අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය උද්ගත නොවන අතර එම ගණුදෙණුව සම්බන්ධයෙන් නියෝජිතයා වන දයාබරන් පෞද්ගලිකව වගකිව යුතුය. ඒ අනුව දයා ට්‍රේඩින් සමාගමට සිදුවූ අලාභය දයාබරන්ගෙන් අයකරගත හැකිය.

*නඩු තීන්දු - Preger V Baltspiel Stamp & Heacock Ltd*

*(ලකුණු 05)*

## 03 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a)

| 10 පරිච්ඡේදය - ව්‍යාපාර පරිසරයට අදාළ වැරදි සහ ඒවා පාලනයට ඇති නව රෙගුලාසි |
|---|

**පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම තුනක්**

- වෙළෙන්දෙකු සන්තකයේ පවතින භාණ්ඩ විකිණීම ප්‍රතික්ෂේප කිරීම
- වෙළඳාම් කිරීමේ කාර්යය සඳහා වෙළෙන්දෙකු විසින් අත්පත් කරගත් යම් භාණ්ඩයක් තමා සන්තකයේ නොමැති බව පවසා සිටීම.
- භාණ්ඩ අලෙවි කිරීමේදී පාරිභෝගිකයා මත මිල හැර වෙනත් කොන්දේසි පැනවීම.
- සාමාන්‍ය වෙළඳ නියමයන් ඉක්මවා භාණ්ඩ සන්තකයේ තබා ගැනීම.
- නිශ්චිතව දක්වා ඇති ප්‍රමිති හා තත්වයන්ට අනුකූල නොවන භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.
- මිල ගණන් නියම කර ඇති හෝ ලකුණු කර ඇති අවස්ථාවකදී උපරිම මිලට වඩා වැඩි මිලට භාණ්ඩ විකිණීම.
- යම් භාණ්ඩයක ලේබලය හෝ විස්තරය වෙනස් කිරීම, මකා දැමීම, කටුගා දැමීම හෝ විරූප කිරීම හා එවැනි භාණ්ඩ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම.
- භාණ්ඩ නිෂ්පාදනය, ආනයනය, අලෙවිකරණය,ගබඩා කිරීම, විකිණීම, රැස් කිරීමට අදාළ වන විධිවිධාන උල්ලංඝණය කිරීම.
- පාරිභෝගිකයා නොමඟ යවන සුලු හෝ වංචනික ක්‍රියාවක නිරත වීම.

***(ලකුණු 03)***

(b)

| 10 පරිච්ඡේදය - ව්‍යාපාර පරිසරයට අදාළ වැරදි සහ ඒවා පාලනයට ඇති නව රෙගුලාසි |
|---|

මුදල් විශුද්ධිකරණය පනතේ නීති විරෝධී ක්‍රියාකාරකම යන්නෙන් මෙහි පහත සඳහන් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන ක්‍රියාවක් අදහස් වේ

**පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක්:**

- විෂ ද්‍රව්‍ය අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත
- ත්‍රස්තවාදය වැළැක්වීමට අදාළව බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- අල්ලස් පනත
- ගිනි අවි, පුපුරන ද්‍රව්‍ය හෝ අන්තරදායක ආයුධ පනත
- විනිමය පාලන පනත
- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- සයිබර් අපරාධ සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- ළමුන්ට එරෙහි වැරදි හා පුද්ගල ජාවාරම සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- මරණීය දණ්ඩණයෙන් හෝ අවුරුදු හතකට වඩා වැඩි කාලයක් සිර දඬුවම් පැමිණිවිය හැකි යම් වරදක් සංයුක්ත වන නීතියක්.

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 05)***

## 04 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

03 පරිච්ඡේදය - භාණ්ඩ විකිණීමේ නීතිය

(a) 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 2(1) වගන්තිය අනුව භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යනු,

'' මිල නැමති ප්‍රතිෂ්ඨාවකට භාණ්ඩවල හිමිකම(අයිතිය) විකුණුම්කරු විසින් ගැණුම්කරු වෙත පැවරීම හෝ පැවරීමට එකගවීමට ඇති කර ගන්නා ගිවිසුමකි''

(b) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මූලික ලක්ෂණයක් ලෙස ''මිල'' හදුනාගත හැකිය. භාණ්ඩයක වටිනාකම මුදලින් ප්‍රකාශ කිරීම මිල වන අතර භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් නිර්මාණය වීමට භාණ්ඩයේ ප්‍රතිෂ්ඨාව මුදලින් තීරණය කොට තිබිය යුතුය. අවම වශයෙන් නාමික වටිනාකමක් හෝ මුදලින් නියම විය යුතුය.

ත්‍යාග සහ නොමිලේ සැපයෙන ප්‍රවර්ධන පිරිනැමීම්වල වටිනාකම මිලක් මගින් නියම නොවන නිසා එවැනි ගිවිසුම් භාණ්ඩ විකිණීමේ ගිවිසුම් වශයෙන් හඳුනා නොගැනේ.

*(ලකුණු 05)*

## 05 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

06 පරිච්ඡේදය - හවුල් ව්‍යාපාර සහ සමාගම් නීතියේ මූලිකාංග

තමන් විසින් නිකුත් කරන ලද යම් චෙක්පතක් සම්බන්ධයෙන් බැංකුව විසින් ගෙවීම් කිරීමට පෙර එකී ගණුදෙණු නතර කිරීමට ගණුදෙනුකරුවෙකුට බලය තිබේ.

චෙක්පතක ගෙවීම් ප්‍රතිනියෝග කිරීම බැංකුවක් වෙත ගණුදෙණුකරුවෙකු නිකුත් කරන උපදෙසක් වන අතර එම උපදෙස මත බැංකුව ක්‍රියා කළ යුතු වේ.

යම් බැංකුවක නොසැලකිමත්කම නිසා ගණුදෙණුකරු නිකුත් කරන ලද ප්‍රතිනියෝගයක් ක්‍රියාත්මක නොවීමෙන් ගණුදෙණුකරුවෙකුට ඇතිවන අලාභ සම්බන්ධයෙන් බැංකුව වගකීමට බැඳේ.

*නඩු තීන්දු - Burnett V Wesminister Bank*

කෙසේ නමුත් ගෙවීම් නතර කිරීමේ ප්‍රතිනියෝගයක් බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට නම් එම නියෝගය පිළිබඳව ගණුදෙණුකරුවෙකු විසින් කරන ලද නිත්‍ය දැන්වීමක් බැංකුව සතු විය යුතු අතර, ඒ පිළිබඳව කෙරෙන සම්ප්‍රයුක්ත දැන්වීමක් පමණක් ඒ සඳහා ප්‍රමාණවත් නොවේ.එනම් බැංකුවේ සිටින වගකිවයුතු නිළධාරියෙකුගේ අවධානයට ලක්වෙන පරිදි ප්‍රතිනියෝගය සන්නිවේදනය කළ යුතුය.

*නඩු තීන්දු - Curtice V London city and Midland Bank Ltd*

සෑම් විසින් පෝල්ට ගෙවීම් නැවැත්වීමට ප්‍රතිනියෝගයක් සිදු කර ඇත්තේ වුවද එකී නියෝගය චෙක්පත සඳහා මුදල් ගෙවන තෙක් බැංකුකරු වෙත ලැබී නැත. ඒ අනුව චෙක්පත ගෙවන අවස්ථාවේ චෙක්පත ප්‍රතිනියෝග කිරීම පිළිබඳව නිත්‍ය නියෝගයක් බැංකුව වෙත ලැබී නැත. ප්‍රතිනියෝගය බැංකව වෙත සන්නිවේදනය වී ඇත්ද යන්න පිළිබඳව සෑම් විසින් සොයා බැලීමක්ද සිදු කොට නැත. ඒ අනුව චෙක්පතේ මුදල් ගෙවීම සම්බන්ධයෙන් බැංකුව වගකිව යුතු නොවේ.

ඒ අනුව චෙක්පතෙහි සඳහන් මුදල බැංකුවෙන් අයකර ගැනීමට සෑම්ට අයිතියක් නැත.

*(ලකුණු 05)*

## 06 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

09 පරිච්ඡේදය - අන්තර්ජාතික වෙළෙඳාම

බැංකුවක් විසින් නියම කරන ලියවිලි භාරදුන් පසු ගෙවීම් කිරීමට එකග වන කොන්දේසියක් ලෙස ණයවර ලිපි (සලේඛණ ණය) හදුනාගත හැකිය

මෙහිදී විකුණුම්කරුගේ නමින් විකුණුම්කරුගේ බැංකුවේ(දැනුම් දෙන බැංකුවේ) ණයක් විවෘත කරන ලෙසට ගැණුම්කරු විසින් ඔහුගේ බැංකුවට(නිකුත් කරන බැංකුවට) උපදෙස් දෙයි.

විකුණුම්කරුට අදාළ මූල්‍ය පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය නම් ඔහු බැංකුවට ලබා දිය යුතු ලේඛන ගැනද ගැණුම්කරු විශේෂයෙන් සඳහන් කර යවයි. ගැණුම්කරුගේ උපදෙස්වල ණය පහසුකම කල් ඉකුත්වන දිනයද සඳහන් කර යවයි.

එබැවින් ණය පහසුකම් කල් ඉකුත්වීමට ප්‍රථම විකුණුම්කරු නිශ්චිත ලේඛන( උදා - නෞභාර පත්‍රය, රක්ෂණ සහතිකය, ඉන්වොයිසිය) බැංකුවට ඉදිරිපත් කරයි නම් කලින් සූදානම් කරගත් ආකාරයට බැංකුව විකුණුම්කරුට මුදල් ගෙවයි.

ණයවර ලිපිවලට අදාළ නීතිය අන්තර්ජාතික වාණිජ මණ්ඩලයේ සලේඛණ ණය සඳහා වන ඒකීය චාරිත්‍ර හා භාවිතයන් (Uniform Customs and Practice(UCP))මගින් නියම කොට ඇත

*(ලකුණු 05)*

**B කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a)

07 පරිච්ඡේදය - කම්කරු නීතිය

තාවකාලික සේවකයන් ආවරණය කරනු ලබන්නේ 1958 දරණ සේවක අර්ථසාධක අරමුදල (EPF) පනතේ 15 වන වගන්තිය යටතේය. ඒ අනුව, වසර එකහමාරක කාලය තුළ සේවක අර්ථසාධක අරමුදල සඳහා නයනි හිමිකම් ලබයි.

කෙසේ වෙතත්, ඇයට පුණ්‍යායතනයක් වන 'සෙත්සේවා' පදනමෙහි පත්වීමක් හිමි විය.

එබැවින්, සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පනතේ විධිවිධාන නයනීට අදාළ ද යන්න තීරණය කිරීම සඳහා අප විසින් කළ යුතු වේ.

සේවක සංඛ්‍යාව 10 ට වඩා අඩු නම්, එම සංවිධානය සේවක අර්ථසාධක අරමුදල යටතේ ආවරණය නොකරන අතර සේවක සංඛ්‍යාව 10 ට වැඩි නම්, EPF ප්‍රතිපාදන අදාළ වේ.

(b)

07 පරිච්ඡේදය - කම්කරු නීතිය

සේවකයා විසින් අවසාන මාසයේ ලැබූ වැටුපෙන් අර්ධය සේවා යෝජක වෙත සම්පූර්ණ කළ වසර ගණනින් ගුණකර ලැබෙන අගය පාරිතෝෂිකය ලෙස ලබා ගත හැකිය.

පාරිතෝෂිකය = (අවසාන මාසික වැටුප / 2) x සම්පූර්ණ කළ වර්ෂ ගණන

1,950,000 = (300,000 / 2) x 13

ඒ අනුව බර්ට්ට රුපියල් 1,950,000 ක පාරිතෝෂිකයකට හිමිකම් කිව හැකිය.

*(මුළු ලකුණු 10)*

## 08 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

06 පරිච්ඡේදය - හවුල් ව්‍යාපාර සහ සමාගම් නීතියේ මූලිකාංග

කමල්, ගීතා හා රාජා පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයේ හවුල් කරුවන් අතර ලිඛිත හවුල් ගිවිසුමක්(හවුල් ව්‍යවස්ථාවලියක්) නොමැති අතර ඔවුන් 1890 හවුල් ඈඳා පනත අනුගමනය කිරීමට එකඟව ඇත.

ඒ අනුව ඔවුන් අතර ඇති මතභේදාත්මක තත්වයයන් හවුල් ඈඳා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව විසඳා ගත යුතුය.

- **කමල්ට ප්‍රචාරණ ආයතනයේ එදිනෙදා වැඩ කටයුතුවලින් ඉවත්ව සිටීමට ඇති අවශ්‍යතාවය**

1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තිය අනුව ව්‍යාපාරයේ සෑම හවුල්කරුවෙකුම හවුල් ව්‍යාපාරයේ කළමණාකරණ කටයුතු වලට සම්බන්ධ විය යුතුය. ඒ අනුව ව්‍යාපාරයේ එදිනෙදා කටයුතුවලට සම්බන්ධ වීමට කමල්ට යුතුකමක් ඇති අතර එසේ ඔහු සම්බන්ධ වීම පාලනය කිරීමට හෝ ඊට බාධා කිරීමට කිසිදු හවුල්කරුවෙක්ට හැකියාවක් නොමැත.

- **කමල්ට ඔහුගේ බිරිඳ නව හවුල්කරුවෙකු ලෙස හඳුන්වාදීමට ඇති අවශ්‍යතාවය**

1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තිය අනුව ව්‍යාපාරයට නව හවුල්කරුවෙකු හඳුන්වා දීම සියලුම හවුල්කරුවන්ගේ කැමැත්තෙන් සිදු කල යුතුය. කමල්ගේ බිරිඳ නව හවුල්කරුවෙකු ලෙස හඳුන්වාදීමට දැනට හවුල් ව්‍යාපාරයේ සිටින හවුල්කරුවෙකු වන ගීතා අකමැති බැවින් කමල්ට සිය බිරිඳ නව හවුල්කාරිනියක ලෙස හඳුන්වා දීමට කමල්ට අයිතියක් නැත.

- **ගීතාට අමතර ලාභයක් ලැබීමට ඇති අවශ්‍යතාවය**

1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයේ ලාභ හා අලාභ හවුල්කරුවන් සමානව බෙදාගත යුතු අතර හවුල් ව්‍යාපාරය අවසන් කරන විට ප්‍රාග්ධනයද හවුල්කරුවන් අතර සමානව බෙදාගත යුතුය. ඒ අනුව ගීතාට හවුල් ව්‍යාපාරයේ ලාභයෙන් අමතර ලාභයක් ලැබීමේ අයිතියක් නොමැත.

- **රාජාට ව්‍යාපාරය කළමණාකාරීත්වය වෙනුවෙන් වැටුපක් ලැබීමට ඇති අවශ්‍යතාවය**

1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයේ තම සේවය වෙනුවෙන් හවුල්කරුවෙකු වේතනයක් නොලැබිය යුතුය. ඒ අනුව රාජාට ව්‍යාපාර කළමණාකාරීත්වය වෙනුවෙන් වේතනයක් ලැබීමේ අයිතිවාසිකමක් නොමැත.

- **ව්‍යාපාරයේ ස්භාවය වෙනස් කිරීම**

1890 හවුල් ආඥා පනතේ 24 වන වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයේ සාමාන්‍ය ව්‍යාපාරික තීරණ බහුතර කැමැත්ත මත ක්‍රියාත්මක කළ හැකි අතර හවුල් ව්‍යාපාරයේ ස්භාවය වෙනස් කිරීමට අදාළ තීරණයක් ගත යුත්තේ සියලු හවුල්කරුවන්ගේ කැමැත්ත ඇතිවය. ගීතාගේ කැමැත්ත නොමැතිව අනෙකුත් හවුල්කරුවන්ට හවුල් ව්‍යාපාරයේ ස්භාවය වෙනස් කළ නොහැකිය.

*(ලකුණු 10)*

## 09 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a)

| 08 පරිච්ඡේදය - රක්ෂණ නීතිය, කුලී සින්නක්කර ගිවිසුම් සහ කල්බදු |
|---|

රක්ෂණ ගිවිසුමක් රක්ෂණ හිමිකමකින් තහවුරු විය යුතුය. යම් කිසි විෂය වස්තුවක් රක්ෂණය කිරීමට රක්ෂිතයාට ඇති නීත්‍යානුකූල අයිතිය රක්ෂණ හිමිකමයි.

දේපළ රක්ෂණයක් සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකුට රක්ෂණ හිමිකමක් ඇති වීමට නම් එකී පුද්ගලයාට එකී දේපළ පැවතීමෙන් මූල්‍යමය වාසියකුත් එකී දේපළ විනාශ වීමෙන් මූල්‍යමය අවාසියකුත් සිදු විය යුතුය.

ඒ අනුව දේපළක් සම්බන්ධයෙන් අයිතියක්, ගිවිසුම් අයිතියක් හෝ වගකීමක් ඇති අයෙකුට දේපළ සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් ඇති වේ.

මධුර ඔහුට අයිතිය පැවති කේවල ස්වාමි ව්‍යාපාරයේ දේපළ ඔහු කොටස් හිමිකාරීත්වය දරන XYZ පුද්ගලික සමාගමට පවරා ඇත. නෛතික පුද්ගලභාවයේ සංකල්පය අනුව ඔහු තව දුරටත් එම දේපළ වල

හිමිකරු නොවේ. ඒ අනුව දේපළ සමාගම වෙත පැවරීමෙන් පසු දේපළ සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් මධුර වෙත නැත.

දේපළ රක්ෂණයකදී රක්ෂණ ගිවිසුම ඇති කර ගන්නා අවස්ථාවේ මෙන්ම රක්ෂණ වන්දි ඉල්ලා සිටින අවස්ථාවේදීද රක්ෂිතයා සතුව රක්ෂණ හිමිකම පැවතිය යුතුය.

මධුර ගින්නෙන් හානි වූ දේපළ සඳහා වන්දි හිමිකම් පාන අවස්ථාවේ එකී දේපළ සම්බන්ධයෙන් මධුරට රක්ෂණ හිමිකමක් නැත.

ඒ අනුව රක්ෂණ සමාගමට මධුරගේ ඉල්ලීම ප්‍රතික්ශේප කිරීමට නෛතික අයිතියක් ඇත.

*නඩු තීන්දු - Macaura V Nothern Assurance*

(b)

**08 පරිච්ජේදය - රක්ෂණ නීතිය, කුලී සින්නක්කර ගිවිසුම් සහ කල්බදු**

පුද්ගලික වන්දි හා ජීවිත රක්ෂණ හැර අන් සියලුම රක්ෂණවලට මෙම මූලධර්මය අදාළ වේ.

මෙම මූලධර්මය අනුව රක්ෂණ ගිවිසුමෙන් ආවරණය කරන ලද උවදුරකින් යම් රක්ෂිත දේපළකට අලාභයක් සිදු වුවහොත් එකී දේපළ පූර්ව තත්වයට පත් කිරීමට ප්‍රමාණවත් මුදලක් පමණක් රක්ෂකයා විසින් වන්දි වශයෙන් ගෙවනු ලබයි.

එලෙස ගෙවන මුදල තීරණය වන්නේ රක්ෂණ සහතිකය මඟින් ආවරණය කෙරෙන ප්‍රමාණයට යටත්වය.

මෙම සංකල්පයේ අර්ථය වනුයේ යමෙකුට රක්ෂණය මඟින් ලාභ ඉපයිය නොහැකි බවයි.

*නඩු තීන්දු - Castellain V Preston*

**(මුළු ලකුණු 10)**

***C* කොටසෙහි අවසානය.**

## D කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 25)

# 10 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**(a)**

| 02 පරිච්ඡේදය - ගිවිසුම් නීතිය |
|---|

(i) වලංගු ගිවිසුමක් නිර්මාණය වීම සඳහා අර්පණකරුගේ අර්පණය අර්පණලාභියා විසින් ප්‍රතිග්‍රහණය කළ යුතුය.

එය අර්පණලාභියාගේ ප්‍රකාශිත වචනවලින්, ක්‍රියාවක් මගින් හෝ හැසිරීමක් මගින් විය හැකිය.

කෙසේ නමුත් නිහඬතාවය හෝ අක්‍රීයභාවය ව්‍යංග ප්‍රතිග්‍රහණයක් වශයෙන් නොසැලකේ.

*නඩු තීන්දු - Felthouse V Bindly*

ප්‍රියා විසින් කරනු මෝටර් රථය රුපියල් මිලියන දෙකකට ඉල්ලා සිටිමින් රොමේෂ් වෙත කරන ලද අර්පණය රොමේෂ් ප්‍රතිග්‍රහණය කිරීමට අපේක්ෂා කළද ඔහු ප්‍රතිග්‍රහණය හැඟවෙන කිසිදු සක්‍රිය ක්‍රියාවක් සිදු කොට නැත.

රොමේෂ් විසින් අර්පණය ප්‍රතික්ෂේප නොකරමින් නිහඬව සිටීම ප්‍රතිග්‍රහණයක් ලෙස සැලකිය නොහැක.

ඒ අනුව ප්‍රියාගේ අර්පණයට අදාළව වලංගු ප්‍රතිග්‍රහණයක් ඇති වී නොමැත. එසේ හෙයින් ප්‍රියා හා රොමේෂ් අතර වලංගු ගිවිසුමක් දැකිය නොහැක.

**(ලකුණු 06)**

(ii) රොමේෂ් හා ප්‍රියා අතර වලංගු ගිවිසුමක් නොපවතින නිසා රොමේෂ්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ අයිතියක් ප්‍රියා සතු නොවේ.

ගිවිසුම් අවසන් කිරීම හා සම්බන්ධ වේ.

ප්‍රියා හා මල් මල් ෆ්ලොරිස්ට් අතර පවතින ගිවිසුමේ මූලික හරය (අරමුණ) වනුයේ ප්‍රියාගේ විවාහයේ තේමාවට අනුව සියලුම සැරසිලි ස්භාවික මල් භාවිතයෙන් සිදු කිරීම වේ.

ගිවිසුම්ගත ආකාරයට සියලුම මල් සැරසිලි ස්භාවික මල් භාවිතයෙන් සිදු කිරීමට මල් සැරසිලිකරු අසමත් වන ලදී. ඊට හේතු වූයේ පෙර දිනයේ ඇති වූ ධාරානිපාත වර්ෂාව සමඟ ඇතිවූ දරුණු ගංවතුර තත්වයයි.

එම වැසි තත්වය මත ඇතිවූ රෝස මල් සපයා ගැනීමේ අපහසුව ගිවිසුම ව්‍යවර්ථ වීමක්ද යන්න සලකා බැලිය යුතුය. මන්දයත් එකී තත්වය මගින් ගිවිසුම් ව්‍යවර්ථ වීමක් ස්ථාපිත වේ නම් ගිවිසුම්ක වගකීම්වලින් මල් මල් ෆ්ලොරිස්ට් මුක්ත වන බැවිනි.

*නඩු තීන්දු - Taylor V Caldwell*

*Avery V Bowden*

ගිවිසුමක් ව්‍යවර්ථ වීම යනු ගිවිසුම නිර්මාණය වීමෙන් පසුව ගිවිසුමේ පාර්ශවයන්ගේ සාධාරණ පාලනයෙන් බැහැර ක්‍රියාවක් හේතුවෙන් ගිවිසුම ඉටු කළ නොහැකි තත්වයට පත් වීමයි.

වර්ෂා තත්වය උද්ගත වූයේ උත්සවයට පෙර දිනයේ බවත්, ප්‍රමාණවත් තරම් මල් පූර්වයෙන් මිලදී ගෙන ආරක්ෂිතව ශීත ගබඩා කාමරවල ගබඩා කොට තබා ගෙන භාවිතා කළ හැකි බවත් පෙනී යයි.

ඒ අනුව වර්ෂාව නිසා මල් සොයාගත නොහැකි වීම මල් මල් ෆ්ලොරිස්ට්ගේ සාධාරණ පාලනයෙන් බැහැර ක්‍රියාවක් නොවේ. එය මල් මල් ෆ්ලොරිස්ට් හා ප්‍රියා අතර ඇති ගිවිසුම ව්‍යවර්ථ වීමට හේතුවත් නොවේ.

එසේම ඇති වූ හදිසි තත්වය ප්‍රියාට සන්නිවේදනය කොට එකගතාවයකට පැමිණීමට මල් මල් ෆ්ලොරිස්ට් අමසත්ව ඇත.

ඒ අනුව මල් මල් ෆ්ලොරිස්ට් ගේ ක්‍රියා කලාපය තුළ ගිවිසුමේ මූලික හරය බිඳ වැටෙන හෙයින් ගිවිසුම උල්ලංඝණය වී ඇත.

*නඩු තීන්දු - Paussard V Spiers*

එක් පාර්ශවයක් විසින් ගිවිසුම කඩකළ විට ගිවිසුම ප්‍රජහනය (Repudiate) වූ ලෙස සලකා ඒ මත තව දුරටත් කටයුතු කිරීමට ප්‍රතික්ෂේප කිරීමට නිර්දෝශී පාර්ශවයට අයිතියක් ඇත.

ඒ මත තමන්ට සිදු වූ අලාභය සලකා ඉදිරි ගෙවීම් ප්‍රතික්ෂේප කිරීමට ප්‍රියාට අයිතිවාසිකම් ඇත.

***(ලකුණු 09)***

b) (i)

**03 පරිච්ඡේදය - භාණ්ඩ විකිණීමේ නීතිය**

භාණ්ඩ විකිණීමේ අඥා පනතේ ව්‍යංග වගන්ති මත පදනම් වේ

භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 15(2) වගන්තිය අනුව වෙළෙන්දෙකු විසින් සමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර විකුණනු ලබන භාණ්ඩ වෙළඳ තත්වයේ පැවතිය යුතුය.

එනම් විකුණුම්කරු විසින් විකුණනු ලබන භාණ්ඩය, එහි සාමාන්‍ය භාවිත අරමුණට උචිත විය යුතුය.

ටීනා විසින් මුලදී ගත් මුහුණු ආලේපනය එහි අන්තර්ගත මූල ද්‍රව්‍ය හේතුවෙන් සුරක්ෂිත නොවීම නිසා එහි සාමාන්‍ය භාවිත අරමුණ සඳහා භාවිතා කිරීමේ හැකියාවක් නැත.

ඒ අනුව ස්කින් හෙයා කෙයාර් විසින් භාණ්ඩ විකිණීමේ අඥා පනතේ ව්‍යංග කොන්දේසියක් කඩ කර ඇත.

*නඩු තීන්දු - Wren V Holt*

තව දුරටත් භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 15(1) වගන්තිය මගින් දක්වා ඇති වෙළෙන්දෙකු විසින් සමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර විකුණනු ලබන භාණ්ඩ ගැණුම්කරු විසින් ව්‍යංගයෙන් හෝ ප්‍රකාශිතව ඉදිරිපත් කරනු ලබන අවශ්‍යතාවයට සුදුසු විය යුතුය යන ව්‍යංග කොන්දේසියද උල්ලංඝණය වී ඇත.

ටීනා විසින් මුහුණු ආලේපනයක් ඉල්ලා සිටීමේදී අවශ්‍යතාවය ව්‍යංගයෙන් සන්නිවේදනය කොට ඇත.

*නඩු තීන්දු - Grant V Australlian Knitting Mills*

*Frost V Aylesbury Diary Company Ltd*

ස්කින් ඇන්ඩ් හෙයාර් කෙයාර් විසින් භාණ්ඩ විකිණීමේ අඥා පනතේ ව්‍යංග කොන්දේසි දෙකක් කඩ කොට ඇත.

ඒ අනුව ටීනාට විනුණුම්කරුවෙකුට එරෙහිව ගැණුම්කරුවෙකුට ඇති ප්‍රතිකර්ම ක්‍රියාත්මක කළ හැකිය.

කෙසේ නමුත් මේ අවස්ථාවේ ටීනාට ඇති ප්‍රතිකර්මය වනුයේ විකුණුම්කරුට නඩු පවරා අලාභ අය කර ගැනීමයි.

***(ලකුණු 05)***

(ii)

**03 පරිච්ඡේදය - භාණ්ඩ විකිණීමේ නීතිය**

භාණ්ඩ විකිණීමේ අඥා පනතේ ව්‍යංග වගන්ති මත පදනම් වේ

භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 15(1) වගන්තිය මගින් දක්වා ඇති වෙළෙන්දෙකු විසින් සමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර විකුණනු ලබන භාණ්ඩ ගැණුම්කරු විසින් ව්‍යංගයෙන් හෝ ප්‍රකාශිතව ඉදිරිපත් කරනු ලබන අවශ්‍යතාවයට සුදුසු විය යුතුය යන ව්‍යංග කොන්දේසියද උල්ලංඝණය වී ඇත.

සුරාජ් විසින් අවශ්‍ය කෑම මේසය තේක්ක ලීයෙන් කරන ලද්දක් බව දන්වා ඇත.

එසේම සුරාජ් මෝස්තරයද නිශ්චිත වශයෙන් විකුණුම්කරුට දන්වා ඇත.

එම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන භාණ්ඩයක් භාර දීමෙන් විකුණුම්කරු භාණ්ඩ අවශ්‍යතාවයට සුදුසු විය යුතුය යන ව්‍යංග කොන්දේසිය කඩ කොට ඇත.

*නඩු තීන්දු - Baldry V Marshall*

ඒ අනුව සුරාජ්ට විකුණුම්කරුවෙකුට එරෙහිව ගැණුම්කරුවෙකුට ඇති ප්‍රතිකර්ම ක්‍රියාත්මක කළ හැකිය.

කොන්දේසි කඩ වීම මත සුරාජ්ට භාණ්ඩ භාර ගැනීම ප්‍රත්ක්ෂේප කිරීමට හිමිකම් ඇත. එහෙත් සුරාජ් දැනටමත් භාණ්ඩ භාර ගෙන ඇත. මෙහිදී කොන්දේසි කඩවීම සැලකිය හැක්කේ ප්‍රතිඥාභාර කැඩීමක් ලෙස වන අතර ගැණුම්කරුට වන්දි ඉල්ලා සිටීම පමණක් කළ හැකිය.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 25)**

***D* කොටසෙහි අවසානය.**

***Notice :***

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".

The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2019 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*

*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*